බියගම ප්‍රාදේශීය සභාව
ගම්පහ දිස්ත්‍රික්කය
---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 16 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බියගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පෙර වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව අපහරණය කළ භාණ්ඩ වර්ග 106 ක පිරිවැය ගිණුම් වලින් ඉවත්කර නොතිබුණි. | පිරිවැය ගිණුම්වලින් ඉවත් කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට ක්‍රියා කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ඉදිකරන ලද රු.5,973,584 ක් වටිනා ස්ථාවර වත්කම් ගිණුම්ගතකර නොතිබුණි. | වත්කම් ගිණුම් ගත කළයුතු වේ. | ඉදිරි වර්ෂයේදී අදාළ වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (iii) | ගිණුම් විෂයයන් 6 ක ශේෂ හා උපලේඛන ශේෂයන් අතර රු.21,322,018 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | මේ සම්බන්ධව පරික්ෂා කර බලා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද වර්ෂ 1ත් 3ත් අතර එකතුව රු.11,285,631 ක ණයගැති ශේෂ හා රු.31,637,564 ක ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අය කර ගැනිමටත් , ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමත් සිදු කළයුතු වේ. | මේ සම්බන්ධව අවශ්‍ය ගැලපිම් සිදු කොට වර්ෂ 1 ත් 3 ත් අතර ශේෂයන් ඉවත්කිරීමට කටයුතු යොදා ඇත. |

1.5 **අනුකූල නොවීම**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | දෙන ලද රු.795,218 ක අතුරු අග්‍රිමය පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | මෙම ව්‍යාපෘතියේ (බහු කාර්ය ගොඩනැගිල්ල) වැඩ අවසන් කර නොමැති බැවින් අත්තිකාරම් අය කරගෙන නැත. වැඩ නිම කර ගෙවීම් කිරීමේදී මෙම අත්තිකාරම් මුදල් අය කර ගැනීමට ක්‍රියා කරමි. |
| මුදල් රෙගුලාසි 571 | වර්ෂ 2 ඉක්ම වූ රු.2,863,547 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | මේ සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.142,915,121 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.94,521,294 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 දෙසැම්බර් හා 2015 ජනවාරි මාස වල නිකුත්කර තිබූ රු.64,732 ක් වටිනා චෙක්පත් පසු මාසයේ නිශ්කාශනය වී තිබුණද මුදල් පොතට නොගැලපීම හේතුවෙන් දිගින් දිගටම නිශ්කාශනය නොවූ චෙක් ලෙස බැංකු සැසඳුම් ප්‍රකාශනයේ දක්වා තිබුණි. | ගැලපීම කර නිවැරදි කරගත යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට ක්‍රියා කරමි. |

## 2.3 <u>ආදායම් පරිපාලනය</u>

### 2.3.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 වර්ෂය | | | | 2017 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 77,752,222 | 81,010,773 | 89,250,071 | 29,039,953 | 75,598,163 | 82,175,598 | 85,504,030 | 37,279,250 |
| කුලී | 5,058,860 | 5,101,750 | 4,677,487 | 10,910,880 | 4,738,860 | 4,788,947 | 4,667,967 | 10,485,518 |
| බලපත්‍ර ගාස්තු | 2,469,000 | 3,798,671 | 3,833,671 | 3,333,297 | 2,447,000 | 3,057,244 | 3,232,844 | 3,368,297 |
| වෙනත් ආදායම් | 243,621,656 | | 273,382,966 | - | 234,545,600 | - | 203,382,096 | - |

### 2.3.2 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

සභාවේ පූර්ව වර්ෂයේ රැස්කල ආදායම රු. මිලියන296.7 ක් වූ අතර ඊට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රැස්කල ආදායම රු.මිලියන 371.1 කි. ඒ අනුව රු.මිලියන 74.4 ක් වැඩි වී තිබූ අතර සභාවේ ආදායම වැඩි වීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණේ මුද්දර ආදායම රු. මිලියන 150 ක් ප්‍රවර්තන වර්ෂයේදී ලැබීම් විය.

### 2.3.3 <u>වරිපනම් හා බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙනෙන ලද රු.37,279,250 ක හිග වරිපනම් ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළ සියයට 21 පමණක් අය කර ගෙන තිබුණි. | හිඟ වරිපනම් ආදායම් අයකරගැනීමට කටයුතු කළයුතු වේ. | 2018 වර්ෂයේ අය කරගෙන ඇති මුළු හිග වරිපනම් මුදල රු. 26,745,510.77 කි. එය මුළු හිඟ මුදලින් (රු.37,279,250) සියයට 71.74 කඩවත උප කාර්යාල බල ප්‍රදේශයට අදාලව 2016 හා 2017 වර්ෂයන්හි පරිගණකගත කරන ලද වරිපනම් දේපල අතරින් කුඹුරු, ආගමික පොදු දේපල, සභාව සතු දේපල හා අධිවේගී මාර්ගය තැනීම සඳහා රජයට පවරා ගන්නා ලද දේපල 2018 වර්ෂයේදී ඉවත් කරන ලද බැවින්, පෙර වර්ෂයට වඩා එම වර්ෂයේ වරිපනම් දේපල සංඛ්‍යාව අඩු වී ඇත. |

2.3.4 **<u>කුලී</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුළු හිඟ කඩ කුලී වටිනාකම රු.6,560,426 ක් වූ අතර ඉන් රු.4,420,942 ක හිඟ කඩ කුලි අය කිරිම කඩ හිමියන් විසින් අධිකරණයට යොමු කරනලද නඩු නිසා අය නොවි තිබුණි. | හිග ශේෂ අයකර ගතයුතු වේ. | ශේෂ අයවෙමින් පවතී. |

2.3.5 **<u>කර්මාන්ත හා ව්‍යාපාර බදු</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 10 ට වැඩි රු.3,090,660 ක කර්මාන්ත හා ව්‍යාපාර බදු ශේෂ නිරවුල් කර ගැනීමට සභාව පියවර ගෙන නොතිබුණි. | හිග ආදායම් අය කර ගැනිම කාර්යක්ෂම කළයුතු වේ. | පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව මෙම මුදල් කපා හැරීමට කටයුතු කරමින් පවතී. |

2.3.6 **<u>වෙනත් ආදායම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සම්ප්‍රේෂණ කුළුණු සම්බන්ධව සමීක්ෂණයක් කර බල ප්‍රදේශයට අයත් සියළුම කුළුණු හඳුනාගෙන ගාස්තු අය කිරීමට සභාව අපොහොසත්වී ඇති අතර හඳුනාගත් කුළුණු වලින්ද ව්‍යාපාර බදු හා වරිපනම් බදු සියල්ල අයකරගෙන නොතිබූ අතර ප්‍රවර්තන වර්ෂය අවසානයේ දුරකතන කුළුණු 15 කින් රු.172,692 ක වරිපනම් ආදායමක් පමණක් එකතුකර තිබුණි. | සභා බල ප්‍රදේශයට අයත් සම්ප්‍රේෂණ කුළුණු හඳුනාගෙන ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළයුතු වේ. | භෞතිකව සමීක්ෂණයක් කරමින් දුරකථන කුළුණු හඳුනාගෙන ආදායම් එකතු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

2.3.7 **<u>පරිසර බලපත්‍ර</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයට සභාව වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබූ ආයතන 71 කට 2019 මැයි 14 වන විටත් පරිසර බලපත්‍ර නොතිබුණි. | පරිසර බලපත්‍ර ආයතන හඳුනාගෙන බලපත්‍ර ලබා දීමට කටයුතු කළයුතු වේ. | මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කර ඇති 2008 පෙබරවාරි 01 දිනැති සහ 1534/18 දරන ගැසට් පත්‍රයට අදාළව පරිසර බලපත්‍රයක් ලබා ගතයුතු කර්මාන්ත අතරින් ' ඇ' කොටසට පමණක් පළාත් පාලන |

ආයතනවලින් බලපත්‍ර ලබා දීමට නිර්දේශ කර ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | ------------------------------- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 08 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ඒ අනුව කටයුතු කළ යුතු වේ. | බස්නාහිර පළාත් සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඇත. |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ------------- | ------------------------------------ |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු ළදරු පාසැල්, ආදාහනාගාර, පුස්තකාල හා ක්‍රීඩා පිටි ආදී පොදු පහසුකම් වලට අදාල කර්තව්‍යයන් ඉටුකර ගැනීමට අනුකූල වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම සභාවේ මෙහෙවර හා පරමාර්ථ ඉටුකර ගැනීමට අනුකූලව පිළියෙල කළයුතු වේ. | පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකර ගැනීමට අනුකූල වන පරිදි 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කොට නිවැරදි කර ඇත. |

(ඇ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබූ අතර 2011 ජූලි 05 දිනැති අංක 1713/11 දරන ගැසට් පත්‍රය හා 2007 අංක 01 දරණ බස්නාහිර පලාත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි ප්‍රඥප්තිය ප්‍රකාරවද කසළ කළමනාකරණ කටයුතු සිදුකර නොතිබුණි. එමෙන්ම ගැසට් පත්‍රය ප්‍රකාරව කසළ බදු හෝ ගාස්තු පැනවීම හා සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳව අධීක්ෂණ කමිටුද පිහිටුවා නොතිබුණි . | පවතින නීති රීතිවලට අනුකූලව කසළ කළමනාකරණය සිදුකළයුතු වේ. | ඉදිරියේදී කසළ බදු හෝ ගාස්තු පනවා සෞඛය ආරක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳව අධීක්ෂණ කමිටු පත් කර නිවැරදි කිරීමට ක්‍රියා කරමි. |

(ඈ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ප්‍රාදේශීය සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් ගෝලීය දර්ශක තුළින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 වර්ෂය වෙනුවෙන් සකස්කර නොතිබුණි. | තිරසර සංවර්ධන සංයුක්ත සැලසුම් සකස් කර ඒ අනුව ක්‍රියාත්මක කළයුතු වේ. | 2019-2023 තිරසර සංවර්ධන සංයුක්ත සැලසුම් සකස් කර ඒ අනුව ක්‍රියාත්මක වෙමින් පවතී. |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලොරි රථයක් මිලදී ගැනීමේ අවශ්‍යතාවය තිබියදී සභාව විසින් දිගින් දිගටම කුලී පදනම මත ලොරි රථ ලබාගෙන තිබුණි. ඒ අනුව ප්‍රවර්තන වර්ෂයේදී මාර්ග අංශයේ කුලීරථ සඳහා පමණක් රු.3,647,600 ක මුදලක් ගෙවා තිබුණි. | අවශ්‍යතාව මත මිලදී ගැනීම යෝග්‍ය වේ. | ඉදිරියේදී මේ සම්බන්ධව සලකා බලා විශේෂ අවධානය යොමු කර නව ලොරි රථයක් මිලදී ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) (i) | අනුමත කාර්යමණ්ඩලය අනුව ආදායම් පරීක්ෂක තනතුරු 04 ක් පුස්තකාලයාධිපති තනතුරු 01 ක්ද ද්විතීයික පුරප්පාඩු ලෙස පැවති අතර තාක්ෂණ නිලධාරි තනතුරු 01 ක් හා සංවර්ධන නිලධාරි තනතුරු 01 ක් ලෙස ද්විතීයික අතිරික්තයක්ද පැවතුණි. තවද ප්‍රාථමික පුරප්පාඩු යටතේ ක්ෂේත්‍ර කම්කරු තනතුරු 02 ක් හා සෞඛ්‍ය කම්කරු තනතුරු 01 ක් පුරප්පාඩුව පැවතුණි. | කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු වේ. | පුරප්පාඩු පවතින තනතුරු සඳහා බඳවා ගැනීමට පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යවා ඇත. |
| (ii) | 2014 දෙසැම්බර් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 පරිදි ප්‍රාථමික සේවා ගණයේ සෞඛ්‍ය කම්කරු 10 ක් , ක්ෂේත්‍ර කම්කරු 01 පෙර පාසල් සහයක 03 ක් ලෙස 14 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබාදී තිබුණද උක්ත චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තාකර අනුමත කාර්යය මණ්ඩලයට ඇතුලත් කරගෙන නොතිබුණි. | අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කිරීමට කටයුතු කළයුතු වේ. | සභාව සඳහා නව අනුමත කාර්ය මණ්ඩලයක් නිකුත් කරන බවත් ඒ තුළට මෙම සංඛ්‍යාව ඇතුළත් නොකරන බවත් සඳහන් කරන ලදී. මෙම සංඛ්‍යාව කාර්තු වාර්තා වල වෙනමම පෙන්වා එවන ලෙස උපදෙස් ලැබුණි. |
| (ආ) | සේවය අතහැර යාම නිසා වසර 5ක සිට අයකර ගත නොහැකිව ණය ශේෂ 03 කට අදාලව රු.43,015 ක් පැවතුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | එම මුදල් ගෙවන ලෙස දැනුම් දී ඇත. |
| (ඇ) | දැනට සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් පස් දෙනෙකුට අදාලව රු.40,585 ක ඇප තැන්පතු හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන් පස්දෙනෙකුට අදාල රු.33,873 ක ඇප තැන්පතුද නිදහස් කරීමකින් තොරව වර්ෂය අවසානය වන විටත් සභාව සතුව පැවතුණි. | සේවයේ නොමැති නිලධාරින්ගේ ඇප තැන්පත් මුදල් නිදහස් කළයුතු වේ. | එම මුදල් නිදහස් කිරීමට අදාලව ඉදිරියේදී ක්‍රියා කරමි. |

3.4 **වත්කම් කළමනාකරණය**

3.4.1 **පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රවර්තන වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරිය මගින් සභාවට ලබාදී රු.4,716,000 ක් වටිනා වත්කම් 2019 මැයි 16 වන විටත් සභාවට පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි. . | පවරා නොගත් වත්කම් පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | මෙම ට්‍රැක්ටර් රථ හා ටේලර් රථ වහාම පවරා ගැනීමට ක්‍රියා කරමින් පවතී. |

3.4.2 **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආයුධ හා ආම්පන්න පිළිබඳ සමීක්ෂණයක් කර සත්‍ය තොගය ගිණුම්වලට ගැනීමට කටයුතුකර නොතිබුණි. | සත්‍ය තොගය ගිණුම්වලට ගත යුතු වේ. | සත්‍ය තොගය ගිණුම්වලට ඇතුලත් කිරීමට ක්‍රියා කරමි. |

3.5 **ප්‍රසම්පාදනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හා 8.9.1 (ආ) අනුව ගිවිසුමක් ලියා අත්සන් කළයුතු වුවද, ලිඛිත ගිවිසුමක් නොමැතිව රු.2,779,378 කට වායු සමීකරණ යන්ත්‍ර සැපයීම හා සවිකිරීම සිදුකරගෙන තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළයුතු වේ. | වායු සමීකරණ යන්ත්‍ර මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 8 පරිච්ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත් ප්‍රදානයක් සිදු නොවන අතර ඉදිරි සේවා කටයුතු සඳහා සේවා ගිවිසුමක් අත්සන් කර ඇත. |
| (ආ) | ප්‍රවර්තන වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත්ව නැති මිලදී ගැනීම් සිදුකල සහ ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් මිලදී ගැනීම් සිදු නොකළ අවස්ථා 26 ක් නිරීක්ෂණය විය. | මිලදී ගැනීම් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කළයුතු වේ. | ඉදිරියේදී මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

3.5.1 **කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ---------------------------- | --------------- | -------------------------------------- |
| පොදු අරමුදල් ව්‍යාපෘතිවලට අමතරව ව්‍යාපෘති 50 ක් සභාවට ක්‍රියාත්මක කිරීමට අනුමත වී තිබුණද ව්‍යාපෘති 16 ක් නිමකර නොතිබුණි. | යෝජිත ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා ගැනීම සහ ගිවිසුම් අත්සන් කිරීම සිදු කළයුතු වේ. | "සුඛිත පුරවර" ව්‍යාපෘති ක්‍රියාත්මක තත්ත්වයේ පවතී.ව්‍යාපෘති 11 නියමිත දිනට ව්‍යාපෘති ගිවිසුම්ගත නොවීම නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නතර කරන ලදී. |